# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2242/3 - 2021 අගෝස්තු මස 24 වැනි අඟහරුවාදා - 2021.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

### ජනාධිපති විධානය

1. පුරාවිද්‍යා චක්‍රවර්තී පූජ්‍ය එල්ලාවල මේධානන්ද නායක ස්වාමින් වහන්සේ
2. උතුර සහ නැගෙනහිර දෙපළාතේ සහ තමන්කඩුව දිශාවේ ප්‍රධාන සංඝනායක අරිසිමලේ ආරණ්‍ය සේනාසනාධිපති පූජ්‍ය පනාමුරේ තිලකවංශ නායක ස්වාමින් වහන්සේ
3. අස්ගිරි පාර්ශවයේ අතිපූජ්‍ය වෙඩරුවේ ධර්මකීර්ති ශ්‍රී රතනපාල උපාලි අභිධාන අනුනායක ස්වාමින් වහන්සේ
4. මල්වතු පාර්ශවයේ මහාලේඛකාධිකාරී ආචාර්ය පූජ්‍ය පහමුණේ සුමංගල නායක ස්වාමින් වහන්සේ
5. අස්ගිරි පාර්ශවයේ මහාලේඛකාධිකාරී ආචාර්ය පූජ්‍ය මැදගම ධම්මානන්ද නායක ස්වාමින් වහන්සේ
6. මල්වතු පාර්ශවයේ කාරක සංඝ සභික ගෞරව ශාස්ත්‍රවේදී අඹන්වැල්ලේ ශ්‍රී සුමංගල ස්වාමින් වහන්සේ
7. මේජර් ජනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න මැතිතුමා
   ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය
8. මහාචාර්ය කපිල ගුණවර්ධන මැතිතුමා
   ලේකම්, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
9. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය අනුර මනතුංග මැතිතුමා
   පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්
10. කීර්ති ගමගේ මැතිතුමා
    ඉඩම් කොමසාරිස් ජනරාල්
11. ඒ. එල්. එස්. සී. පෙරේරා මැතිතුමිය
    මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව
12. මහාචාර්ය රාජ් කුමාර් සෝමදේව මැතිතුමා
    ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කැළණිය විශ්වවිද්‍යාලය


1A - G 34883 — 380 (2021/08)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

13. දේශබන්දු තෙන්නකෝන් මැතිතුමා
    ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, බස්නාහිර පළාත
14. එච්. ඩී. අසිංසලා සෙනෙවිරත්න මැතිතුමිය
    පළාත් ඉඩම් කොමසාරිස්, නැගෙනහිර පළාත
15. දිලිත් ජයවීර මැතිතුමා
    සභාපති, දෙරණ මාධ්‍ය ජාලය
16. මේජර් ජනරාල් (විශ්‍රාමික) නන්දන සේනාධීර මැතිතුමා
    අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

වෙත,

ශුභාශිංසන පූර්වකවය !

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, 2020.06.01 වැනි දින දරන ජනාධිපති විධානය මගින් පිහිටුවන ලද නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් ඔබතුමන්ලා පත් කරනු ලැබ ඇති හෙයින් ද,

තවද, උක්ත කාර්ය සාධක බලකායේ සාමාජිකයින් වශයෙන් පත්කරන ලද මැනුම්පති සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් කටයුතු කරන ලද නිලධාරින් විශ්‍රාම ලබා හෝ ස්ථාන මාරු ලබා ඇති බව හඳුනාගෙන ඇති හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වන ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, උක්ත විධානයේ 11 සහ 16 යන සාමාජිකයින් වෙනුවට පහත සඳහන් නිලධාරීන් එතුමන්ලා ගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් පූර්වෝක්ත ජනාධිපති විධානය ප්‍රකාරව පිහිටවනු ලැබූ නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජිකයින් ලෙස මෙයින් පත් කරමි.

1. ඩබ්ලිව්. ටී. එම්. එස්. බී. තෙන්නකෝන් මැතිතුමා
   මැනුම්පති, මිනින්දෝරු දෙපාර්තමේන්තුව
2. මේජර් ජනරාල් (විශ්‍රාමික) එන්. ආර්. ලමාහේවාගේ මැතිතුමා
   අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව

වර්ෂ දෙදහස් විසිඑකක් වූ අගෝස්තු මස 18 වැනි දින වූ මෙදින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී.බී. ජයසුන්දර,**
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.